ශ්‍රී ලංකාවට එන බොහෝ විදෙස් සංචාරකයින්ව, ඔවුන්ගේ සමේ වර්ණය පදනම් කරගනිමින් පොදුවේ "සුද්දෝ" යනුවෙන් හැඳින්වීමේ පුරුද්දක් ඇති බව සැබැවකි. ඒ අනුව, මාධ්‍ය තුළද ඇතැම් විට "සුද්දෝ" යන යෙදුම භාවිතා වනු දක්නට ලැබේ.

ඊට උදාහරණයක් ලෙසින්, "නාඋල සතිපොළට සුද්දෝ ඇවිත්" ලෙසින් දිනමිණ පුවත්පතේ (11/11) පළවූ පුවත් සිරස්තලයක් දැක්විය හැක. එම පුවතේ අන්තර්ගතයේ සඳහන්ව තිබුණේ "විදෙස් ජාතිකයන්" ලෙසිනි.

1) මෙසේ සමේ වර්ණය පදනම් කරගනිමින් "සුද්දන්" ලෙසින් ඇතැම් විදෙස් සංචාරකයින් හැඳින්වීම ඔස්සේ, ඔවුන්ව සමේ වර්ණය පදනම් කරගනිමින් සිදුවන කොන් කිරීමකට ලක් වෙතැයි ඔබ නොසිතන්නේ ද?

2) ඔබ සිතනා ලෙසට, මෙම සිරස්තලය "නාඋල සතිපොළට විදේශිකයන් ඇවිත්" හෝ "නාඋල සතිපොළට සංචාරකයන් ඇවිත්" ලෙසින් ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍ය නොවේ ද?